වෙහෙසෙන නවෝත්පාදකයෙකි. එහෙත් ශ්‍රමිකයෙක් වූ කලී වාණිජ පදනමකින් නව්‍යතාවන් හඳුන්වාදීමට වෙහෙසෙන්නෙක් නොවේ.

- ව්‍යවසායකයන් අවදානම් දරන්නන් වන අතර, ඔවුහු අවදානම තුළින්ම සමෘද්ධිමත් වෙති. අනික් අතට කම්කරුවෝ හැමවිටම අවදානමෙන් වැළැකීමට කටයුතු කරති.

- එදිනෙදා කටයුතු සඳහා අදාළ නොවන, එහෙත් ව්‍යාපාරික ආයතනයේ දිශානතිය හා ගමන්මග තීරණය කෙරෙන, මූලික ප්‍රතිපත්තිමය තීරණ ව්‍යවසායකයන් විසින් ගනු ලබන අතර එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසායකයා ශ්‍රමිකයන් කුලියට ගනී.

(වෙනස්කම් දැක්වෙන ඕනෑම කරුණු දෙකක් සඳහා එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)

(ii) - "වැඩිවන ආවස්ථික පිරිවැය නීතියෙන්" අදහස් කෙරෙනුයේ නිෂ්පාදන හැකියා වක්‍රයක් මත, එක් භාණ්ඩයක නිෂ්පාදනය සමාන ඒකකවලින් ක්‍රමයෙන් වැඩි කරන විට, ඒ වෙනුවෙන් කැප කිරීමට සිදුවන අනික් භාණ්ඩයේ ප්‍රමාණය හෙවත් ආවස්ථික පිරිවැය, ක්‍රමයෙන් ඉහළ නගින බවය.

(ලකුණු 02 යි)

| |
|---|
| (**විකල්ප පිළිතුරක් :** වැඩිවන ආවස්ථික පිරිවැය නීතියෙන් අදහස් කෙරෙනුයේ සම්පත් පූර්ණ ලෙස උපයෝජනය කර ඇති විටක කිසියම් භාණ්ඩයක නිෂ්පාදනය වැඩි කිරීමේ දී එහි ආවස්ථික පිරිවැය හෙවත් එම භාණ්ඩය වෙනුවෙන් කැප කිරීමට සිදුවන අනික් භාණ්ඩයේ නිෂ්පාදනය ක්‍රමයෙන් ඉහළ නගින බවය) |

වැඩිවන ආවස්ථික පිරිවැය නීතියට බලපාන සාධක තුනකි.

- නිෂ්පාදන සම්පත් (සාධක) සමජාතීය නොවීම (එබැවින් එක් සාධකයක් වෙනුවෙන් වෙනත් සාධකයක් පූර්ණ වශයෙන් ආදේශකයක් ලෙස යොදාගත හැකි නොවේ).

- විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදය කිරීමේ දී යොදා ගනු ලබන නිෂ්පාදන ක්‍රම ශිල්ප වෙනස් වීම (වෙනස් තාක්ෂණය යොදා ගැනීම).

- කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා වඩාත් යෝග්‍ය සාධකයක්, වෙනස් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ලා එතරම් යෝග්‍ය නොවීම.

(ඕනෑම හේතු දෙකක් සඳහා එක් හේතුවකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(iii) - කුමක් කොපමණ ප්‍රමාණයකින් නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
- කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද? (ලකුණු 01 යි)


- වෙළෙඳපොළ ආර්ථික පද්ධතිය (ලකුණු 01 යි)
- විධාන ආර්ථික පද්ධතිය (ලකුණු 01 යි)
- සාම්ප්‍රදායික ආර්ථික පද්ධතිය (ලකුණු 01 යි)

('ධනේශ්වර ක්‍රමය' සහ 'සමාජවාදී ක්‍රමය' ලෙස ආර්ථික පද්ධති නම් කොට ඇත්නම් ලකුණු නොලැබේ)




+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(iv) - සේවා වියුක්ති අනුපාතිකයේ ඉහළ යාම.




- සේවා වියුක්තිය පවතින ආර්ථිකයක සේවා වියුක්ති අනුපාතිකය තවදුරටත් ඉහළ ගියහොත්, පවත්නා සම්පත් ඌන උපයෝජනය නිසා මූර්ත නිෂ්පාදිතය සංකෝචනය වේ. සැබෑ නිමැවුම දැක්වෙන ලක්ෂ්‍යය A සිට B දක්වා විතැන්වේ.

- වැඩකරන වයසේ ජනගහනය ඉහළ යාම.




- වැඩකරන වයසේ ජනගහනය ඉහළ යාමක් නිසා ආර්ථිකයේ සම්පත් සම්භාරයේ ප්‍රසාරණයක් හටගනී.

මේ නිසා නිෂ්පාදන ධාරිතාව හෙවත් විභව නිමැවුම ඉහළ නගී. ප්‍රස්තාර සටහනෙහි මෙය පෙන්නුම් කෙරෙනුයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය AB සිට CD දක්වා දකුණට විතැන් වීමක් මගිනි.

(අක්ෂ නම් කොට සිදුවන වෙනස නිවැරදිව පෙන්නුම් කෙරෙන රූප සටහනට ලකුණු 01 යි. පැහැදිලි කිරීමට ලකුණු 01යි)

(v) - ආර්ථික නොවන භාණ්ඩයක් හෙවත් නොමිල භාණ්ඩයක් ලෙස හඳුන්වනුයේ හිඟකමක් නොමැති භාණ්ඩයක්ය. එවැනි භාණ්ඩයක් අප සියලු දෙනාගේම වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් තරම් අතිශය සුලබව දක්නට ලැබේ. එම නිසා එවැනි භාණ්ඩයක් කිසිදු කැප කිරීමකින් තොරව ලබාගත හැකිය. ආවස්ථික පිරිවැයක් නොමැත.

(ආර්ථික නොවන භාණ්ඩ නිර්වචනයට ලකුණු 02 යි)

- කිසියම් භාණ්ඩයක් හිඟකමක් සහිත භාණ්ඩයක් හෙවත් ආර්ථික නොව භාණ්ඩයක් ද යන්න නිර්ණය කෙරෙනුයේ, එම භාණ්ඩයට මිලක් අය කරනවා ද එසේ නැතහොත් මිලක් අය නොකොට නොමිලයේ ලබා දෙනවා ද යන්න මත නොවේ. බොහෝ අවස්ථාවල සමාජ ශුභසාධනය හෝ ව්‍යාපාරික ප්‍රවාරණය වැනි හේතු මත ඇතැම් භාණ්ඩ හා සේවා මිලක් අය නොකොට මහජනයාට ලබා දෙන ආකාරය දැකිය හැකි ය. ඒවා නොමිලයේ ලබා දුන්නද, ඒවා නිෂ්පාදනය කිරීම සඳහා විකල්ප භාවිත සහිත හිඟ සම්පත් භාවිත කෙරේ. ඒවායේ නිෂ්පාදනය නිසා ආවස්ථික පිරිවැයක් හටගනී. ඒ බැවින් එම භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ නොවේ. ඒවා ආර්ථික භාණ්ඩ වේ.

(ලකුණු 02 යි)



+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK

- මිල අඩු වීමක ආදේශන ප්‍රතිවිපාකය හැම විටම ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි කරයි. ආදේශන ප්‍රතිවිපාකයේ එම බලපෑම, සෘණ ආදායම් ප්‍රතිවිපාකය විසින් කිසියම් දුරකට නිශේධනය කෙරේ. මෙම ප්‍රතිවිපාක දෙකෙහි සාපේක්ෂ බලවත්කම මත අවසාන ප්‍රතිඵලය තීරණය වේ.

- ඇතැම් බාල භාණ්ඩවලදී ආදේශන ප්‍රතිවිපාකයේ බලපෑම මුළුමනින්ම නිශේධනය කිරීමට සෘණ ආදායම් ප්‍රතිවිපාකය අසමත් වේ. එවිට මිල අඩුවීමක ප්‍රතිඵල වශයෙන් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය තවදුරටත් ඉහළ නගී. එහෙත් එම වැඩිවීම සාමාන්‍ය භාණ්ඩයකදී සිදුවන තරම් විශාල ප්‍රමාණයක් නොවේ. බාල භාණ්ඩයක සාමාන්‍ය රටාව මෙයයි. එබැවින් එය පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයේ හැඩය තහවුරු කරයි.

- සෘණ ආදායම් ප්‍රතිවිපාකය, ආදේශන ප්‍රතිවිපාකයේ බලපෑම අභිබවා යන විටකදී ඉල්ලුම් වක්‍රයේ හැඩය ධන බෑවුමකට අනුරූපීවේ. ගිෆන් භාණ්ඩ නමින් හඳුන්වනුයේ මෙම තත්ත්වයයි. මෙය සිදු වීමට නම් අදාළ භාණ්ඩය බාල භාණ්ඩයක් විය යුතු වේ. එහෙත් එය පමණක් ප්‍රමාණවත් නොවේ. මිල වෙනස් වීමේ සෘණ ආදායම් ප්‍රතිවිපාකය ආදේශන ප්‍රතිවිපාකය මුළුමනින් ම නිශේධනය කිරීමට සමත් ප්‍රමාණයටත් වඩා බලගතු එකක් විය යුතුය. එබැවින් සෑම බාල භාණ්ඩයක්ම ගිෆන් භාණ්ඩයක් නොවේ.

(එක් එක් පියවර සඳහා ලකුණු 01
බැගින් ලකුණු 04 යි)

(iii) - කිසියම් භාණ්ඩයක මිලෙහි හටගන්නා වෙනසක් කෙරෙහි, එම භාණ්ඩයෙහි ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය දක්වන සංවේදීතාව මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මැනේ.

- මෙය ගණනය කරනු ලබන්නේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයෙහි හටගත් ප්‍රතිශතාත්මක වෙනස, එම වෙනස ඇති කිරීමට බලපෑ මිලෙහි ප්‍රතිශතාත්මක වෙනසෙන් බෙදීමෙනි. එය පහත දැක්වෙන ආකාරයට ප්‍රකාශ කළ හැකි ය.

$$\text{මිල ඉල්ලුම් නම්‍යතාව} = \frac{\text{ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ ප්‍රතිශතාත්මක වෙනස}}{\text{මිලෙහි ප්‍රතිශතාත්ම වෙනස}}$$

(නිර්වචනයට ලකුණු 01 යි: ගණනය කෙරෙන
සූත්‍රයට ලකුණු 01 යි මුළු ලකුණු 02 යි)

(iv) (අ) - සමතුලිත මිල හා ප්‍රමාණය

$$Q_D = Q_S$$
$$350 - 10P = -40 + 5P$$
$$390 = 15P$$

$P$ = කිලෝග්‍රෑමයක් රුපි. 26 (ලකුණු 01 යි)

$$Q_D = 350 - 10(26)$$
$$Q_D = 350 - 260$$

$Q_D$ = මෙට්‍රික් ටොන් 90 (ලකුණු 01 යි)



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) - කිලෝග්‍රෑමයකට රුපි 30ක් වන සහතික මිල මත සපයනු ලබන මුළු ප්‍රමාණය :

$$Q_S = -40 + 5P$$
$$Q_S = -40 + 5(30)$$
$$Q_S = -40 + 150 = \text{මෙට්‍රික් ටොන් } 110$$ (ලකුණු 02 යි)

(ඉ) - මුළු සැපයුමම අලෙවිකර ගැනීම සඳහා අයකළ යුතු වෙළෙඳපොළ මිල තීරණය වන්නේ එම ප්‍රමාණය මිලදී ගැනීමට පාරිභෝගිකයන් ගෙවීමට කැමැති මිල මතය.

$$Q_D = 350 - 10P$$
$$Q_D = 110$$

එමනිසා:

$$110 = 350 - 10P$$
$$10P = 350 - 110$$
$$P = \text{කිලෝග්‍රෑමය රුපි. } 24$$

(ලකුණු 02 යි)

(ඊ) උදාහරණය සඳහා රජයෙන් ගොවීන්ට ලැබෙන මුදල:
කිලෝ ග්‍රෑමයක් සඳහා ඌන පූරණය කළ යුතු ප්‍රමාණය
= සහතික මිල (= රුපි. 30) - වෙළෙඳපොළ මිල (රුපි. 24)
= 30 - 24 = කිලෝග්‍රෑමයකට රුපි. 6කි.

ඌනපූරණය කළ යුතු මුළු මුදල } = රුපි. 6 x (110 x 1000)
= රුපි. 660,000

(ලකුණු 02 යි)

**(විකල්ප පිළිතුර : 660)**

(2) - පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය

පාරිභෝගික අතිරික්තය } $= \dfrac{(\text{උපරිම ඉල්ලුම් මිල} - \text{වෙළෙඳපොළ මිල}) \times \text{මිලදීගත් ප්‍රමාණය}}{2}$

$$= \frac{(35 - 24) \times 110{,}000}{2} = \frac{1210{,}000}{2}$$

= රුපි. 605,000 (ලකුණු 02 යි)

**(විකල්ප පිළිතුර : 605)**

නිෂ්පාදක අතිරික්තය $= \left(\text{ගොවීන්ට ලැබුණු මිල} - \text{අවම සැපයුම් මිල}\right) \times \dfrac{\text{අලෙවි මිල ප්‍රමාණය}}{}$

$$= \frac{(30 - 8) \times (110{,}000)}{2} = \frac{1210{,}000}{2}$$

= රුපි. 1,210,000 (ලකුණු 02 යි)

**(විකල්ප පිළිතුර : 1210)**



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii) - කිසියම් කර්මාන්තයකට හෝ වෘත්තියකට හෝ ප්‍රවේශ වීමේ ලා පවත්නා බාධක මින් අදහස් කෙරේ. මේ මගින් කර්මාන්තයේ හෝ වෘත්තියේ හෝ තරගකාරිත්වය සීමා කෙරේ.

- මෙවැනි බාධක විවිධ ස්වරූප ගනී. ඒවා කෘත්‍රිම හෝ ස්වාභාවික හෝ විය හැකිය. නෛතික, තාක්ෂණික, ස්ථානීය හා ආර්ථික සාධක මත හටගත් ඒවා වේ.

(ලකුණු 02 යි)

- උදාහරණ
  - උපාය මාර්ගික වැදගත්කමක් ඇති අමුද්‍රව්‍ය පිළිබඳ හිමිකාරිත්වය හෝ ඒ පාලනය කිරීමේ අයිතිය
  - බුද්ධිමය දේපොළ අයිතිය
  - ස්වාධිකාර
  - බලපත්‍ර
  - බදු ගිවිසුම්
  - පරිමාණුකූල පිරිමැසුම්
  - ස්වාභාවික ඒකාධිකාර (මහජන අපයෝජ්‍යතා කර්මාන්ත)

(එක් උදාහරණයකට ලකුණු 01 බැගින් ලකුණු 02 යි)

(iii) - නිෂ්පාදන ආයතනයක සැපයුම් වක්‍රය පෙන්නුම් කරනුයේ වෙළෙඳපොළේ පවත්නා විකල්ප මිලයන්හිදී සැපයීමට අපේක්ෂාකරන හා සපයනු ලබන භාණ්ඩ ප්‍රමාණයන්ය. පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ලාභ උපරිමනය කරන ආයතනයක් සපයනු ලබන්නේ ආන්තික පිරිවැය හා මිල සමාන කෙරෙන නිමැවුම් ප්‍රමාණයයි. මේ අනුව එක් එක් මිලේ දී සපයනු ලබන ප්‍රමාණ තීරණය වන්නේ ආන්තික පිරිවැය වක්‍රයේ අදාළ ලක්ෂ්‍යයන් සමග මිල ගණන් ගැළපීමෙනි. එලෙස පූර්ණ තරගකාරී ආයතනයේ ආන්තික පිරිවැය වක්‍රය ආයතනයේ සැපයුම් වක්‍රයද වේ.

(ලකුණු 02 යි)

- ආයතනයේ සැපයුම් වක්‍රය සමන්විත වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ඉහළින් පවත්නා ආන්තික පිරිවැය වක්‍රයේ අදාළ කොටසින් සහ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා පහළ මිල ගණන්වලට අදාළ සිරස් අක්ෂයේ (මිල අක්ෂයේ) කොටසින් ද වේ.

(ලකුණු 02 යි)

| |
|---|
| (විකල්ප පිළිතුර: පූර්ණ තරගකාරී ආයතනයක සැපයුම් වක්‍රය වන්නේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම ලක්ෂ්‍යයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රයයි) |

(iv) - කිසියම් නිෂ්පාදන සාධකයක් පවත්නා භාවිතයෙන් ඉවත්ව වෙනත් භාවිතයක් වෙත සංක්‍රාම වීම වළක්වාලීම් වස්, එම සාධකය වර්තමාන භාවිතය තුළ ලැබිය යුතුයයි අපේක්ෂා කරන අවම ඉපැයීම් ප්‍රමාණය සංක්‍රාම ඉපයීම වේ.

- අවශ්‍යයෙන්ම සංක්‍රාම ඉපයීම වූ කලී, කිසියම් සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තැබීමේ ආවස්ථික පිරිවැය වේ. (ලකුණු 02 යි)

- ආර්ථික බදු කුලිය යනු සංක්‍රාම ඉපැයීම ඉක්මවා කිසියම් සාධකයක් හිමිකර ගන්නා අතිරික්තයයි. (ලකුණු 01 යි)

(මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී ප්‍රස්තාර සටහන් අපේක්ෂා නොකෙරේ)



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

